
මව්රට දැන් ඉරිදා
2026 ජුනි 07
හාට්
හදවත් හිරවට්ටන් තැන...
HEART
Morin Gunathilake
Click by **Charuka Perera**

# අජිත් බණ්ඩාරගේ දුව කිව්වම තමයි හැමෝම දන්නේ...

සත්සරණි බණ්ඩාර

**ලාංකීය ජන හදවත් දිනාගත් ගායක අජිත් බණ්ඩාරගේ ආදරණීය දියණිය ඇයයි. බහු කුසලතාවලින් අනූන, නව යොවුන් වියේ සිහින සැබෑ කරගන්නා සොඳුරු චරිතයක්. ගීතයේ සුවඳත්, කලාවේ රසයත් උරුමයෙන් ලැබූ සත්සරණි බණ්ඩාර දැන් ටීවී දෙරණ ඔස්සේ විකාශය වන 'කොළඹ කට්ටිය' හරහා ඇගේ ස්වර මාධූර්යය පෙන්වමින් යන ගමනේදී 'මව්රට' 'හාට්' අපි ඇයටත් ඉඩක් වෙන් කළා.**

**'අජිත් බණ්ඩාරගේ දුව' කියන හැඳුනුමත් එක්ක කලාවට ආපු ඔබ ගැන හැඳින්වීමක් කරමු. මේ දිනවල ටෙලි තිරය හරහා කරගෙන යන වැඩ මොනවද?**

මම සත්සරණි බණ්ඩාර. අජිත් බණ්ඩාරගේ දුව කිව්වාම තමයි බොහෝ දෙනා හඳුනන්නේ. කුරුණෑගල රෝයල් ජාත්‍යන්තර පාසලෙන් තමයි මම අධ්‍යාපනය හැදෑරුවේ. මේ දිනවල ටීවී දෙරණේ විකාශය වන 'කොළඹ කට්ටිය' ඩ්‍රාමා එකේ රඟන කිරීම් කරගෙන යනවා. ඊට අමතරව අරුණ ජයවර්ධන අංකල්ගේ විකාශය වීමට නියමිත මාරම්බරී, රෝස වෙඩිල්ල නාට්‍යවලට සම්බන්ධ වෙලා ඉන්නවා.

**සත්සරණි කොළඹ කෙනෙක්ද?**

නෑ. මගේ ගම සහ පදිංචිය කුරුණෑගල.

**කොළඹට එන්න අදහසක් නැද්ද?**

කොළඹ පදිංචි වෙන්න ලොකු ආසාවක් නැහැ. හේතුව බිසී ලයිෆ් එකක්නේ කොළඹ තියෙන්නේ. ඒත් මගේ ගම හරිම නිදහස්. ඉස්සරහට වැඩකටයුතු එක්ක කාර්යබහුල වුණොත් තමයි තීරණය කරන්න වෙන්නේ කොළඹට එනවද කියන එක.

**රියැලිටි වේදිකාව ජයගන්න ඔබට හැකි වුණා?**

2018 දී හිරු නාලිකාවෙන් කරපු හිරු සුපර් හීරෝ රියැලිටි වැඩසටහනේදී බෙස්ට් ඇක්ට්‍රස් සහ හිරු සුපර් ඩාන්සර් දිනාගැනීමට හැකි වුණා. ඉන් පසු හිරු නාලිකාවේ ටෙලි ෆිල්ම්ස් ගණනාවකම රඟපෑවා.

**ගීත ගායනා කිරීම මට උපතින්ම මගේ අප්පච්චිගෙන් හිමිවුණු දෙයක්.**

**චිත්‍රපටවලට අවස්ථාව ලැබුණේ නැද්ද?**

ෆිල්ම්ස් දෙකක් දැනට කරලා තියෙනවා. බොහෝවිට ජූලි මාසයේ පමණ තිරගත වේවි.

**හැදෑරීමක් ඇතුවද මේ ක්ෂේත්‍රයේ ඉන්නේ?**

මහේන්ද්‍ර පෙරේරා සර්ගේ රංගන පාසලට සම්බන්ධ වෙලා සර් යටතේ රංගනය පිළිබඳ හැදෑරීම් කළා. සර්ගේ මගපෙන්වීම් හා ගුරුහරුකම් නිසා වැඩ ගොඩකට සම්බන්ධ වෙන්න හැකි වුණා.

**රංගනයෙන් දායක වුණු නාට්‍ය ගැන කිව්වොත්?**

මගේ පළමු නාට්‍යය මාරම්බරී. මහේන්ද්‍ර පෙරේරා සර් තමයි මාව ඊට යොමුකළේ. ඉන් පසු රෝස වෙඩිල්ල නාට්‍යයේ රූගත කිරීම්වලට සම්බන්ධ වුණා.

**විකාශය වුණේ 'කොළඹ කට්ටිය' නේද?**

ඔව්. මම රඟපාපු නාට්‍යවලින් මුලින්ම විකාශය වුණේ කොළඹ කට්ටිය නාට්‍යය තමයි.

**'කොළඹ කට්ටිය' නාට්‍යයේ චරිතයක් ලැබීම ගැන සත්සරණි ඔබට මොකද හිතෙන්නේ?**

මගේ ලොකු හීනයක් තමයි සද්ධා සර් සහ ශිවා සර්ගේ නිර්මාණයකට සම්බන්ධ වෙන එක. ඒ හීනේ මට හැබෑ කරගන්න අද වෙනකොට හැකිවෙලා තිබීම ගැන මාරම සතුටුයි. සද්ධා සර්ම කතා කරලා චරිතය ගැන කියලා කරන්න පුළුවන්ද කියලා අහලා මාව විශ්වාස කරලා චරිතයක් මට බාර කළා කියන්නෙම මම ගිය ආත්මේ කරපු ලොකු පිනක්.

**මගේ ජීවිතේ ලොකු අභියෝග යක් වුණේ හිරු සුපර් හීරෝ තරගාවලිය.**

**අප්පච්චි එක්ක සින්දුවක් කරන්න අදහසක් නැද්ද?**

මම අප්පච්චි එක්ක අප්පච්චිගේ පරණ සින්දුවකට කවර් එකක් කරලා රිලීස් කළා. නමුත් අප්පච්චියි මමයි එකට ඔරිජිනල් සින්දුවක් කරන්න නම් තවම අදහසක් නැහැ. නමුත් ආර්යන් ප්‍රඩක්ෂන් සමග එක්වෙලා මම තනියම ගීතයක් කරලා තියෙන්නේ. ළඟදීම ඒක රිලීස් කරන්න හිතාගෙන ඉන්නවා.

**මේ හැකියාවන් සත්සරණිට කොහොමද ලැබුණේ?**

මම හිතන්නේ ගීත ගායනා කිරීම මට උපතින්ම මගේ අප්පච්චිගෙන් හිමිවුණු දෙයක්. නර්තනය හා රංගන හැකියාව මට අම්මාගෙන් ලැබුණු දෙයක්. අපේ අම්මගේ පොඩි කාලේ හීනේ වුණේ රංගන ශිල්පිනියක් වීම. එයාගෙ ඒ හීනේ මම තුළින් එයා බලාපොරොත්තු වුණා. මම හිතන්නේ මේ හැම හැකියාවක්ම එයාලගෙන් මට ආපු දේවල් කියලා.

**ජීවිතේ ලොකුම අභියෝගයක් වුණේ මොකක්ද?**

මගේ ජීවිතේ ලොකු අභියෝග යක් වුණේ හිරු සුපර් හීරෝ තරගාවලිය තමයි. මට හොරෙන් අපේ අම්මා තමයි ඊට අයැදුම් කළේ. ඉස්සෙල්ලාම කැමරාවක් ඉදිරියේ අපේ ප්‍රවීණ රංගන ශිල්පී මහේන්ද්‍ර පෙරේරා සර්, ස්වර්ණා මල්ලවආරච්චි මැඩම්, චන්න පෙරේරා සර් වගේ අය විනිසුරුවන් ලෙස හිටපු තරගාවලියක රඟපාපු එකම මට ලොකු අභියෝගයක්. දැන් මගේ ලොකුම අභියෝගය තමයි 'කොළඹ කට්ටිය' නාට්‍යයේ චරිතය සාර්ථකව නිමාකිරීම.

**පවුලේ අය සහ නෑදෑ හිත මිතුරන්ගේ ප්‍රතිචාර කොහොමද?**

අම්මාගෙන් සහ අප්පච්චිගෙන් ලැබෙන සහයෝගය මට වචනවලින් කියන්න බැහැ. එයාලා නැත්නම් මට මේ කිසි දෙයක් කරගන්න බැහැ. ප්‍රතිචාර අතින් ගත්තම යාළුවෝ නම් එයාලගේ විදිහට මට කියන්නේ 'උඹ මරු බං... උඹව එහෙම දකින්න අපි මාරම ආසයි' කියලා. ඊට අමතරව නෑදෑයන් සහ ගමේ අයගෙන් හොඳ ප්‍රතිචාර ලැබෙනවා.



**උඹ මරු බං... උඹව එහෙම දකින්න අපි මාරම ආසයි...**

**මම ගිය ආත්මෙ කරපු ලොකු පිනක්...**

**අනාගත බලාපොරොත්තු?**

කලාව පැත්තෙන් ඉදිරියටම යන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

**රඟපාන්න කැමැති චරිත තියෙනවද?**

මම ගොඩක් කැමැති ඩ්‍රග්ස්වලට ඇබ්බැහි වූ චරිත, පොෂ් නැති ගැමි පරිසරයේ දුක් විඳින මිනිස්සුගෙ චරිතයක් කරන්න. එහෙම චරිත ලැබුණොත් මට පුළුවන් මගේ උපරිම කැපැසිටි එක ඒ වගේ චරිතවලින් පෙන්වන්න.

ස්ටෙෆනි කොතලාවල




## ජුනි 19 එනවා...

**මෙරට ඩිජිටල් අවකාශයේ අතිශය ජනප්‍රිය චරිත හතක් ප්‍රධාන කොටගෙන නිර්මාණය වී ඇති 'ඒක තමයි මේක' සිනමා පටය, මෙරට පමණක් නොව ලෝක සිනමාවටම නවමු අත්දැකීමක් එක්කරලනුයේ, සමාජ මාධ්‍යය ජාලාවන්හි හාස්‍ය රංගනයෙන් විස්කම් පාමින් විශාල යූටියුබ් ග්‍රාහකයන් සංඛ්‍යාවකගේ ආකර්ෂණයට නතුවූ ජනප්‍රියම චරිත සමූහයක එකතුවෙනි.**



රඟපානවා නම් මෙන්න රඟපෑම්... කාලෙකට පස්සේ ලංකාවේ ටෙලිනාට්‍ය ප්‍රේක්ෂකයෝ එක හුස්මට බලන, සුපිරිම රංගනයක් පුංචි තිරයෙන් දැකගන්න ලැබෙනවා. ඒ වෙන කාගෙ න්වත් නෙවෙයි, රංගන ශිල්පිනී හිමාලි සයුරංගිගෙන්. රොෂාන් රවීන්ද්‍රගේ 'නටත් අයෙක් සුරා මතින්' ටෙලිනාට්‍යයේ 'නන්දි' ගේ චරිතයට පණ පොවමින්, මේ දිනවල රටේම ගෘහණියන්ගේ, කාන්තාවන්ගේ ඇත්තම වේදනාව ඇස් දෙකට කඳුළු එන තරමටම තාත්විකව හිමාලි ප්‍රතිනිර්මාණය කරනවා. මේ සුවිශේෂී රංගනයෙන් ප්‍රේක්ෂක හදවත් දිනාගත් හිමාලි, 'මව්රට' 'හාට්' සමග ළෙන්ගතු වුණේ ඇගේ ඒ අලුත්ම කලා තොරතුරු ඔබ සමග බෙදාගන්නයි.

# වැඩේ කරන්න පුළුවන් නම් අනිවා කරනවා...

හිමාලි සයුරංගි

**මේ දිනවල හිමාලිගේ රංගනය ගැන ගොඩ දෙනෙක් සතුටට පත්වෙනවා. ඔබේ ඒ රංගනය ඔවුන් කතාබහ කරන මාතෘකාවක් බවට පත්වෙලා?**

ඇත්තටම මට ඒ ගැන ගොඩක් සතුටුයි. රොෂාන් රවීන්ද්‍ර අධ්‍යක්ෂණය කරන 'නටත් අයෙක් සුරා මතින්' ටෙලිනාට්‍යය ජනතාවගේ ආදරණීය නිර්මාණයක් බවට පත්වෙලා. ඒ තරමට ඒ සියලු චරිත ප්‍රේක්ෂකයන් වැලඳගෙන හමාරයි. ඒ නිසාම මම ඒ රඟපාන 'නන්දි' චරිතය මගේ ආදරණීය ප්‍රේක්ෂක ජනතාවගේ හදවතේ චරිතයක් බවට පත්වෙලා. මම හිතුවාටත් වඩා ප්‍රේක්ෂකයන්ගේ ආදරය වැඩි වැඩියෙන් ලැබෙනවා. ගොඩක් සතුටුයි. ප්‍රේක්ෂකයන් මේ නිර්මාණය වැලඳගෙන තිබෙන එක ගැන. මගේ ආදරණීය ප්‍රේක්ෂකයන්ගේ ආදරයට සියලු දෙනාටම මම හදවතින්ම ස්තුති කරනවා.

**'නටත් අයෙක් සුරා මතින්' ඔබට දැනුණු විදිය කොහොමද?**

රොෂාන් රවීන්ද්‍රගේ දෙවැනි නිර්මාණය තමයි මේ නිර්මාණය. 'නන්දි' චරිතයට මට ආරාධනා කරලා ගොඩක් කල්. කිසිම අඩුපාඩුවක් නැතිව කරපු නිර්මාණයක්. ඉතාමත් හොඳ සැලසුමක් තිබුණා. මෙහෙම නිර්මාණ කරනවා අඩුයි. සමහර නිර්මාණවල ලොකේෂන් ප්‍රශ්න. තිරපිටපත් ප්‍රශ්න. කෑම බීම ප්‍රශ්න. ඔය වගේ ප්‍රශ්න තියෙනවා. මේ වගේ පිළිවෙළකට වැඩක් කරනකොට අපිට වුණත් වැඩ කරන්න ලොකු පහසුවක් දැනෙනවා. මම කාලෙකින් මේ වගේ හොඳ නිර්මාණයකට සම්බන්ධ වුණේ. නන්දි චරිතයට මගේ මහන්සිය 500% ක් දැම්මා. ඒ තරමට මටම දැනුණු චරිතයක්. අපිට චරිතය දැනෙනවා කියන්නේ ඉතින් ඒ චරිතය බලන ප්‍රේක්ෂක ජනතාවට දැනෙනවා වැඩියි.

> ආදරණීය ප්‍රේක්ෂක ජනතාවගේ හදවතේ චරිතයක් බවට පත්වෙලා.

**අධ්‍යක්ෂවරයා සමග ප්‍රධාන චරිතය රඟපාන එකත් ඒ තරම් පහසු දෙයක් නෙවෙයි නේද?**

රොෂාන් තමයි මගේ සැමියා විදියට රඟපාන්නේ. ඔහු සමග මම මේ විදියේ චරිතයක් රඟපාන පළමු අවස්ථාව තමයි මේ. නන්දිගේ චරිතය වෙනුවෙන් මගේ පැත්තෙන් උපරිම සහාය ලබාදුන්නා.

මගේ ඇඟටම කාවැදුණු චරිතයක් නන්දි. රොෂාන් මා සමඟ රඟපාන ගමන් මාව හැදුවා. රොෂාන් රවීන්ද්‍ර රංගනයට වගේම අධ්‍යක්ෂණයටත් වටිනා සම්පතක් විදියටයි මම දකින්නේ. ගොඩක් සතුටුයි ඔහු සමග මේ විදියට වැඩ කරන්න ලැබුණු එකට.

> නන්දිගේ චරිතය වෙනුවෙන් මගේ පැත්තෙන් උපරිම සහාය ලබාදුන්නා.

**ජීවිතවලට කතාකරන චරිතයක් බවට නන්දි පත්වෙලා?**

මේ කාලේ 100%ක් වටිනා චරිතයක් නන්දි. සමාජයට ලොකු පණිවුඩයක් දෙනවා. විශේෂයෙන්ම කාන්තාවන් මේ වගේ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. කම්පනයට පත්වෙන අයගේ සිතුවිලි තමයි චරිතය හරහා නිරූපණය කරන්නේ. නන්දි වගේ ප්‍රශ්නවලට මුහුණපාන කාන්තාවන් මේ රටේ ඕනෑ තරම් ඉන්නවා. ඔවුන් නිරන්තරයෙන් උත්සාහ කරන්නේ හැම ප්‍රශ්නයක්ම දරාගෙන පවුල් ජීවිතය රැකගන්න. බේබදුකම නිසා පවුල් බිඳවැටීම් කොපමණ සිදුවෙනවද?

**හිමාලිට පුංචි තිරයේ වගේම සිනමාවෙන් දුර ගමනක් යන්න පුළුවන් කෙනෙක්?**

ඇත්තටම ඔව්. මේ වනවිට මම චිත්‍රපට කිහිපයකට සම්බන්ධ වෙලා තියෙනවා. මේ දිනවල 'කොටු' සිනමා නිර්මාණයට සම්බන්ධ වෙලා ඉන්නවා. මගේ බලාපොරොත්තුවත් සිනමාව තමයි. නමුත් ලැබුණු අවස්ථා නම් අඩුයි. එහෙම වෙන්න හේතුව මොකක්ද කියන්න නම් මම දන්නේ නැහැ.

**වෘත්තීය රංගන ශිල්පිනියක් වශයෙන් වැඩකරන නිසා චරිත තෝරා බේරාගැනීමක් කිරීම අපහසු ඇති?**

ඔව්. එහෙම වර්ගීකරණයක් කරන්න මට අපහසුයි. මෙගා කියලා මම සම්බන්ධ නොවී ඉන්නේ නැහැ.

මට කරන්න පුළුවන් දෙයක් නම් මම අනිවාර්යයෙන් භාරගන්නවා. නිර්මාණ ප්‍රතික්ෂේප කිරීම මම කරනවා වැඩියි. ලොකු කාර්යබහුලත්වයක ඉන්න මම කැමැති නැහැ. හැබැයි හොඳ නිර්මාණ පිටපතක් නම් මම කාලවේලාව හදාගෙන සම්බන්ධ වෙනවා.

වසන්ත විතාරණගේ

## ඒක මගේ ඇඟටම කාවැදුණා...



## සීයට පන්සීයක් මහන්සි වුණා...

ප්‍රවීණ නිර්මාණවේදී සුරංග ද අල්විස් අධ්‍යක්ෂණය කළ 'ඒක තමයි මේක' චිත්‍රපටය ජුනි මස 19 වැනිදා සිට දිවයින පුරා සිනමා ශාලාවන්හිදී තිරගත වීමට නියමිතව ඇත.

මෙය සර්ව සම්පූර්ණ විනෝදාත්මක පවුලේ සැමට එක්ව නැරඹිය හැකි චිත්‍රපටයක් වන අතර, ප්‍රේක්ෂකයා නිරන්තරයෙන් සිනා සාගරයක ගිල්විය හැකි හාස්‍ය රසය මතුපිටින් ගලාගියද, වත්මන් ශ්‍රී ලාංකීය තාරුණ්‍යය මුහුණපාන සංකීර්ණ ගැටලු රාශියක් සම්බන්ධව යටි අරුතක් සහිතව වඩාත් ගැඹුරු කතාන්දරයක් සමාජය වෙත ගෙනඑනු ලබයි. මෙහි රංගනයෙන්, රංග ජයකොඩි (ජනා), චමල් රත්නායක (ප්‍රියා), රතිඳු සේනාරත්න (රැට්ටා), ලෝචනා ජයකොඩි (ලෝචි), ලක්මාල් වීරසිරි (ලකා), ශාන් අරෝශ (සිකා), ජනිත් රූපසේන (සිරිල් අයියා) සමගින් සංජානා ඔනාලි, සංගීත් ප්‍රභූ, කළණ ගුණසේකර, ආනන්ද වික්‍රමගේ, පියුමි බොතේජු, රන්ජන් රාමනායක, ජනිත් වික්‍රමගේ, දමිතා අබේරත්න, ශ්‍රීමාල් වෙඩිසිංහ, විල්සන් ගුණරත්න, ආරියසේන ගමගේ, නිල්මිණී කෝට්ටේගොඩ, ඩී.බී. ගංගො ාඩතැන්න, සුමේධ මිහිරාජ, චමීර සිල්වා ඇතුළු විශාල රංගන ශිල්පීන් පිරිසක් එක්වී ඇත. 'ඒක තමයි මේක' චිත්‍රපටය ඉවෝක් රූපහල ෆිල්ම්ස් පුද්ගලික සමාගම සමගින් සංගීතා ෆිල්ම්ස් නිෂ්පාදනය කරනු ලබයි.

# ඉමල්කා ජයසුන්දර

# හිරුගේ ආලෝකයෙන් රියල් ගේමක් ගහපු හිරුගේම දරුවෙක්...

'ඇත්තමයි මං ඔයාට ආදරෙයි...' ඒ වගේ ආදරණීය වචන පෙළක් අහන්න අපි කවුරුත් කැමැතියි. හැබැයි මේ කියන්නට යන්නේ එවැනි ආදර කතාවක චරිතයකට ජීවය දෙන අලුත් කෙනෙක් ගැනයි. ඔහු 'ඇත්තටම මං ඔයාට ආදරෙයි' ටෙලිනාට්‍යයේ අහිංසක ආදරණීය පෙම්වතෙක් ලෙස ඔබ හමුවට එමින් 'උපේන්ද්‍ර'ගේ චරිතයට පණ පොවන ඉමල්ක ජයසුන්දර. මේ සූදානම ඉමල්කගේ කලා තොරතුරු ගැන 'හාට්' පිටුවකට අකුරු කරන්නයි.



**ඉතින් කොහොමද ඉමල්ක?**

හොඳින් ඉන්නවා, ටෙලිනාට්‍යයේ රූගත කිරීම්වලට සම්බන්ධ වෙමින්.

**කාටද මේ තරම් ආදරය කරන්න දඟලන්නේ?**

මගේ පෞද්ගලික ජීවිතය පැත්තෙන් නම් මම තවම එහෙම කාටවත් ආදරෙයි කියලා නැහැ. හැබැයි 'උපේන්ද්‍ර' කියන්නේ අහිංසක පෙම්වතෙක්. ඒ ආදරය විවිධ ප්‍රශ්න සමග ගලාගෙන යන බව දැකගන්න පුළුවන් 'ඇත්තටම මං ඔයාට ආදරෙයි' ටෙලිනටයය සමග එකතු වුණොත්.

**ඔබේ ගමනට හිරු ආලෝකයක්?**

ඇත්තටම ඔව්. මම මුලින්ම රඟපෑවේ 'හිච්චි' ටෙලිනාට්‍යයේ. පසුව 'හිරු කුමරු ආදරේ ගෙනල්ලා' ටෙලිනාට්‍යයේ. දැන් 'ඇත්තටම මං ඔයාට ආදරෙයි'. මේ ටෙලිනාට්‍ය තුනම හිරු රූපවාහිනියේ විකාශය වුණේ. එකම නාලිකාවක මම රඟපාපු ටෙලිනාට්‍ය

විසේකාර කෙල්ලන් අත
දවසින් දවස විවිධ නි
රුවැත්තියන් අතර
වෙන්නේ 'විසේකා
චරිතය හරහා.
වුණාට වේදිකා
ජනප්‍රිය රං
චනුෂිගේ
මේ විදි
කළා

# එක කොටුවක් පැන්නා... තව කොටුවක් පනින්න ඉන්නේ...

## සිළුමිණි අලගියවන්න

සිසු දරුවන්ගේ මනසට කලාත්මක රසවින්දනයක් එකතු කරමින්, ඔවුන්ට කලාවට පිවිසීමට දොර විවර කරන ඇය ගුරුවරියක්. මේ දිනවල ටෙලිනාට්‍ය කිහිපයකින් විවිධ චරිත හරහා ඔබට සමීප වන සිළුමිණි අලගියවන්න රංගන ශිල්පිනිය සමග කෙටි කතාබහකට අපි මෙලෙස ඇය සමග සම්බන්ධ වුණා.



**ටෙලි තිරයේ 'සිළු' සිනමාවට පනින කොටුව...**

**කාලයක් ඔබ නිහඬව ඉඳලා ප්‍රේක්ෂකයන් අතරට නැවත ඇවිත්?**

පාසල් අවධියේ ඉඳලා කලාවට පුදුම ආශාවක් තිබුණේ. එදා ඉඳලා කලාවේ රැඳී සිටීමට නොහැකි වීම ගැන මම අදටත් දුක් වෙනවා. මම ගුරුවරියක් ලෙස උපරිම කැපවුණා. ඒ වගේම මම බිරිඳක් නිසා සහ පවුලේ වැඩකටයුතු නිසා මට කලාව වෙනුවෙන් ලොකු කාලයක් යොදවන්න අපහසු වුණා. දැන් මට එහෙම ලොකු ප්‍රශ්නයක් නැහැ. මගේ පුතා ලොකු ඉලන්දාරියෙක්. පුතා තමයි මාව කලා කටයුතු සඳහා සම්බන්ධ කරන්න උනන්දු කරන්නේ. ඒ වගේම මගේ පවුලේ මවුපියන්, සහෝදර පිරිසගෙන් මට ලොකු සහායක් ලැබෙනවා. ගුරු වෘත්තියේ නිරත වෙන ගමන් මම කලාවට සම්බන්ධ වෙනවා. මේ වනවිට මම බොරැල්ල සී.ඩබ්.ඩබ්. කන්නන්ගර විද්‍යාලයේ නාට්‍ය හා රංග කලා ගුරුවරියක් ලෙස කටයුතු කරනවා.

**සිළුමිණිගේ මේ දිනවල කලා කටයුතු මොනවද?**

මේ දිනවල 'සින්ටෝ' ටෙලිනාට්‍යයේ කුල්වාන්ගේ අක්කා ලෙසට රඟපානවා. ඒ වගේම 'සිහිනෙක තනිවෙලා' ටෙලිනාට්‍යයේ 'යමුනා' චරිතය රඟපානවා. මේ චරිත දෙකටම ප්‍රේක්ෂකයන් ගොඩක් ආදරය කරනවා. 'කොටු' ටෙලිනාට්‍යයටත් මට හොඳ ප්‍රේක්ෂක ආදරයක් ලැබුණා.

**කොටු පැනිල්ලේ තවම අවසානයක් නැහැ නේද?**

'කොටු' ටෙලිනාට්‍යය හරහා මාව ප්‍රේක්ෂකයන් අතරට ගියේ සිළු චරිතය හරහා. ටෙලිනාට්‍යයේ කොටුව නම් පැනලා ඉවරයි. දැන් ඉතින් සිනමාවෙත් කොටුවක් පනින්න තමයි මේ දිනවල සූදානම. 'කොටු' චිත්‍රපටයේ රූගත කිරීම් එක්ක තමයි මේ දිනවල මම කාලය ගතකරන්නේ. මම හිතනවා 'කොටු' ටෙලිනාට්‍යය වගේම 'කොටු' චිත්‍රපටයත් ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය වේවි කියලා.

**සමාජයේ කොටු ගැන විවිධ ආකල්ප තියෙනවා නේද?**

ඔව්. සමාජයේ කොටු පැනිල්ල ඉතා බහුලව සිදුවෙන දෙයක්. ඒ තුළින් කැත වචනයක් විදියට 'කොටු' පාවිච්චි කරනවා. හැබැයි අසංක සායක්කාරගේ කොටු නිර්මාණය ඉතා කලාත්මක ඇහැකින් සැකසෙන නිර්මාණයක්. ඔහු වේදිකාවට කොටු ගෙනවා. ටෙලිනාට්‍ය හරහාත් කොටු නමින් ජනප්‍රිය ටෙලිනාට්‍යයක් නිර්මාණය කළා. ඔහු දැන් සූදානම චිත්‍රපටයක් කරන්න.

වෙන කෙනෙක් කොටු වැරැදි විදියට වුණත් නිර්මාණය කරන්න පුළුවන්. ප්‍රේක්ෂකයන්ට කුතුහලයක් ආපු නිසාමයි කොටු නිර්මාණය ගැන බලන්නට පෙලඹවීමක් ඇති වුණේ. අසංක සායක්කාර ඉතා නිර්මාණශීලී දක්ෂ අධ්‍යක්ෂවරයෙක් ලෙසයි මම දකින්නේ.

**සිළුමිණි පාසල් කාලයේදීමද කලාව හඳුනාගත්තේ?**

මගේ ගම්පළාත වැලිමඩ, මැදවෙල ප්‍රදේශය. මගේ මවුපියන් දෙන්නම ගුරුවරු. මගේ තාත්තා කලාවට ගොඩක් සමීප කෙනෙක්. බණ්ඩාරවෙල විශාකා බාලිකා විද්‍යාලයට තමයි මම මුලින්ම ගියේ. පසුව උසස් අධ්‍යාපනය සඳහා බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයට ගියා. පාසලේ බාහිර ක්‍රියාකාරකම් සඳහා මම ලොකු උනන්දුවක් දක්වපු කෙනෙක්. පාසල් සමස්ත ලංකා නාට්‍ය තරගවලින් මම ජයග්‍රහණ ලබාගත්තා.

> මගේ ගම්පළාත වැලිමඩ, මැදවෙල ප්‍රදේශය. මගේ මවුපියන් දෙන්නම ගුරුවරු.

**'රොමියෝ ජුලියට්' ඔබේ කලා දිවියේ මැජික් එකක් වුණා?**

ජයනාත් බණ්ඩාර අයියා හරහා තමයි මට මේ අවස්ථාව ලැබුණේ. රොමියෝගේ මව විදියට මම තවමත් රොමියෝ ජුලියට් වේදිකා නාට්‍යයේ රඟපානවා. ඔහු සහ තිමිර උඩලමත්තගේ 'සංසාරණී' මම රංගනයෙන් දායක වුණු පළමු ටෙලිනාට්‍යය. කැමරාව ඉදිරියේ රඟපෑම ගැන මට ලොකු අවබෝධයක් තිබුණේ නැහැ. ඉතින් මට ඒ ගැන වැඩිදුර හැදෑරීමට මගේ වයස නොබලා මම අසංක සායක්කාරගේ රංගන වැඩමුළුවට සම්බන්ධ වුණා. ඉතින් මේ තුන්දෙනාගෙන්ම ලැබුණු සහායත් එක්ක තමයි මට අද මේ තැනට නැවත එන්න ලැබුණේ. 'රොමියෝ ජුලියට්' වේදිකා නාට්‍යය මට මැජික් එකක් වගේ තමයි.



**මගේ පුතා ලොකු ඉලන්දාරියෙක්...**

වසන්ත විතාරණගේ

...රට එකතු වුණු ඇය චනුෂි දෙව්මිණි. ...ර්මාණ අතරට එකතු වන ... මේ දිනවල ඔබට චනුෂි සමීප ...රී' ටෙලි සිතුවමේ නෙත්මිණි ... ඇය පුංචි තිරයට අලුත් ...කාවෙන් කලා ලොවට ආපු ...ගන ශිල්පිනියක්. ඉතින් ... කලා දිවියේ වගතුග ...දියට අපි කතාබහ ...



# ෆස්ට් ටයිම් කොල්ලෙක්ව කරට ගත්තේ...

**චනුෂි මේ දිනවල 'විසේකාරී' සමග ගෙවන ජීවිතය කොහොමද?**

හොඳටම හොඳයි. පාරක බැහැලා යන්න බැරි තරමට මගතොටදී හමුවෙන අය නෙත්මිණි ලෙස මාව දැනහඳුනාගෙන කතාබහ කරනවා. සතුටුයි මගේ පළමු ටෙලි අත්දැකීම මේ විදියට අත්විඳින්න ලැබීම ගැන.

**චරිතය දුර ගිය තරමට අවසානයේ කොල්ලෙක් කරේ තියාගෙන යන්නත් වුණා නේද?**

ඒ අවස්ථාව නම් කවදාවත් අමතක වෙන්නේ නැති තරම්. ජීවිතේ පළමු වතාවට මං කොල්ලෙක් කරට ගත්තේ. ආදරය කරන කොල්ලා මට වඩා කොටයි. ඔහුව රැග් එකෙන් බේරගන්න මට කරේ තියාගෙන යන්න වුණා. මගේ චරිතයට හොඳ පාට්නර් කෙනෙක් තමයි සංගීත් චරිතය රඟපාන දිනුෂ ප්‍රතිභා. මගේ චරිතයට උපරිම සාධාරණයක් කරන කෙනෙක් ඔහු. මතක සිදුවීම් රැසක් සමග 'විසේකාරී' සමග සතුටින් රූගත කිරීම්වලට එකතු වෙනවා.

**වේදිකාවේ මේ දිනවල ඔබගේ පෙරළිය කොහොමද?**

හොඳින් කරගෙන යනවා. වේදිකාව කියන්නේ මගේ ජීවිතයෙන් එක් කොටසක්. ඒ තරමට මම වේදිකාවට මාරම ආදරෙයි. මොකද මම වේදිකාවෙන් ආපු කලා ශිල්පිනියක් නිසා. මේ දිනවල රවීන්ද්‍ර ආරියරත්නගේ 'මිනිහා තමයි මිනිහා' වේදිකා නාට්‍යය සමග රට පුරා යනවා. අබිල සපුමාල්ගේ මගපෙන්වීම යටතේ තමයි මම වේදිකාවට ගොඩවුණේ.

**වේදිකාවෙන් පුංචි තිරයට එන අයට හොඳ පිළිගැනීමක් තියෙනවා කියන්නේ ඇත්තද?**

අනිවාර්යයෙන්ම එකපාරට ටෙලිනාට්‍යයකට සම්බන්ධ වෙනවාට වඩා මට වුණත් ලොකු වෙනසක් දැනුණා. මේ වනවිට මම වේදිකා නාට්‍ය දහයක විතර රඟපාලා තියෙනවා. ඉතින් ඒ නිර්මාණ හරහා මට ජනප්‍රිය ශිල්පීන් රැසක් හඳුනා ගන්න ලැබුණා. ඒ විතරක් නෙවෙයි ක්ෂේත්‍රයේ වැඩ කරන ගොඩ දෙනෙක් හඳුනාගත්ත නිසා මට ඉතා පහසුවෙන් සියලු දෙනාගේ සහාය ඇතිව මට පැවරෙන චරිතයට බයක් සැකක් නැතුව කරගන්න ලොකු පහසුවක් දැනුණා.

**ටෙලිනාට්‍යයක සහ වේදිකාවේ ඔබේ රංගන කුසලතාවට ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාරවල වෙනස කොහොමද?**

ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ හරියට රංගනයක නිරත වෙලා ඔවුන්ගෙන් ඒ මොහොතෙම ප්‍රතිචාරයක් ලබනකොට මාරම සතුටක් දැනෙනවා. ටෙලිනාට්‍යයක චරිතයක් නිරූපණය කරලා හැබැයි ලැබෙන ප්‍රේක්ෂක ප්‍රතිචාර වැඩියි. මොකද ඒ හරහා ගොඩක් ප්‍රේක්ෂකයන් අතරට යන්න පුළුවන්. ඔවුන්ගේ ආදරය දිනාගන්න පුළුවන්. ඒ කොහොම වුණත් රංගන ශිල්පිනියක් වශයෙන් මගේ උපරිම සහාය ඉදිරියටත් මම දෙනවා.

**'මේක ආදර කතාවක්' තුළින් ඔබේ ගමන තවත් සුන්දර වුණා?**

2025 රාජ්‍ය නාට්‍ය උළෙලේ කෙටි නාට්‍ය අංශයෙන් රවින්ද්‍ර සම්පත් වික්‍රමසේකර රචනා කළ ගයාන් සඳකැලුම් අධ්‍යක්ෂණය කළ 'මේක ආදර කතාවක්' නාට්‍යයේ 'සරා' ප්‍රධාන චරිතය රඟපෑවේ මම. ඒ වෙනුවෙන් රංග කුසලතාවක් මට ලැබුණා. වේදිකාවේ ලබාගත්ත පළමු ඇගයීම මට මගේ ඉදිරි ගමනට ලොකු ආශීර්වාදයක් වුණා.

**ඒ ආදර කතාව ඒ විදියට නිමාවෙනකොට ඔබේ සැඟවුණු ආදර කතාව කොහොමද?**

එහෙම ආදර කතාවක් මට දැන් නැහැ. ආදරය කරලා නැහැ කිව්වොත් ඒක බොරුවක්. හැබැයි මම තවම පෙම්වතියක් නෙවෙයි.

**පවුලේ එකම දරුවා විදියට යන ගමන රැකගන්නේ කොහොමද?**

මට ගෙදරින් කිසිම බලපෑමක් නැහැ. මම යන හැම තැනම මගේ අම්මා මා ළඟින්ම ඉන්න එක මට ලොකු ශක්තියක්. මම නිතරම හිතන්නේ මම ගෙදරින් එළියට බහින්නේ වැඩකට කියලා. අරමුණ අවසන් කරලා ගෙදර එනවා. මඩ ගහන පිරිසක් ඉන්නවා. හැබැයි තමන් ලස්සනට හරියට ගමන යනවා නම් එච්චරයි.

**වසන්ත විතාරණගේ**



> **කොල්ලා මට වඩා කොටයි...**

> **ලොකු වෙනසක් දැනුණා...**

> **පෙම්වතාගේ චරිතය රඟපාලා නැති නිසා පොඩි කුතුහලයක් වගේම බයකුත් තිබුණා.**



# ෆිල්ම් එකක හීරෝ වුණා වගේ පිස්සු හැදෙන ෆීලින් එකක් ආවේ...

...තුනම විකාශය වෙනකොට මමත් හිරුගේ දරුවෙක් කියන හැඟීම මට දැනෙනවා.

**ඔබට 'උපේන්ද්‍ර' වෙන්න ලැබුණු අවස්ථාව ගැන කතා කළොත්?**

හිරු රූපවාහිනිය හරහා ඔඩිෂන් එකක් තිබුණා 'අපේ ගම' පරිශ්‍රයේ. මමත් එයට සම්බන්ධ වුණා. මම හිතන්නේ ළමයි දොළොස් දෙනෙක් විතර ඒ ඔඩිෂන් එකට සහභාගි වෙලා හිටියා. මම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වෙලා යන්න හදද්දි විරාජ් වැලිවත්ත සර් මට කතා කළා. ඔහු මට කිව්වේ පරිස්සමට ඉන්න, වැඩක් තියෙනවා කියලා. ඉතින් මගේ පෙනුමත් එක්ක විරාජ් සර් සහ ටෙලිනාට්‍යයේ අධ්‍යක්ෂ ධනුෂ්ක රත්නායක අයියා දෙන්නම කතාබහ කරලා මාව උපේන්ද්‍ර චරිතයට තෝරාගෙන තියෙනවා. ඔය විදියට තමයි ටෙලිනාට්‍යයක ප්‍රථම වතාවට අහිංසක පෙම්වතකුගේ චරිතයක් රඟපාන්න මට අවස්ථාව ලැබුණේ.

**ඉමල්කගේ හිතේ බලාපොරොත්තුවක් තිබුණද හීනය ජය ගන්න?**

මම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා වැඩි කාලයක් නැහැ. හැබැයි මගේ ගමන වෙනුවෙන් මම ගොඩක් මහන්සි වුණා. ඒ වෙනුවෙන් රංගනය හැදෑරීමට පවා ගියා. උත්සාහය මම අතහැරියෙම නැහැ.

**පොඩි කුතුහලයකුත් තියෙන්න ඇති නේද?**

පෙම්වතාගේ චරිතය රඟපාලා නැති නිසා පොඩි කුතුහලයක් වගේම බයකුත් තිබුණා.

> **හැමෝගෙන්ම ලොකු සපෝට් එකක් ලැබුණා...**

හැබැයි ටෙලිනාට්‍යයේ ධනුෂ්ක රත්නායක අයියා ඇතුළු සියලු දෙනාගෙන් මට මාරම සහායක් ලැබුණා. ඒ වගේම ධනුෂ්ක අයියාගේ නිර්මාණවල මම රසිකයෙක්. ඒත් මම කවදාවත් හිතුවේ නැහැ ඔහුගේ ටෙලිනාට්‍යයක මට මේ විදියට රඟපාන්න ලැබේවි කියලා. ධනුෂ්ක අයියා මගේ ඉදිරි ගමනට වටිනා උපදෙස් ටිකක් දුන්නා.

**ඔබේ රඟපෑම සිනමා ශාලාවක දකිනකොට මොන වගේ සිතුවිල්ලක්ද ආවේ?**

පී.වී.ආර්. සිනමා ශාලාවේ ඇත්තමයි මං ඔයාට ආදරෙයි ටෙලිනාට්‍යයේ පළමු කොටස නරඹනකොට මට දැනුණේ මම චිත්‍රපටයක රඟපෑවා වගේ හැඟීමක්. මේ වගේ අත්දැකීමක් මම අත්වින්ද පළමු අවස්ථාව. ඒ වගේම හිරු ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, ටෙලිනාට්‍යයේ සියලු ශිල්පීන් සමග එකට වාඩිවෙලා අත්විඳපු ඒ මිහිරි අත්දැකීම මට කවදාවත් අමතක වෙන්නේ නැහැ.

**වසන්ත විතාරණගේ**

# මගේ පක්ෂේ ඇතුළෙන්ම මඩ ගැහුවා... කකුලෙන් ඇද්දා...

# හරි කාලේ ආවම ආපහු එනවා...

## ලංකාවේ පොලිටික්ස් තවම හරි ට්‍රැක් එකට වැටිලා නැහැ...



**ඕෂධී හේවාමද්දුම. ඈ ගැන අලුතෙන් හඳුන්වා දිය යුතු නැහැ. කෙටි සටහනක් කියනවා නම්, නිළියක වන ඉලක්කයක හෝ හීනයක හිටපු නැති ඕෂධී අහම්බෙන් ලැබුණු චාන්ස් එකකට 'සැඩ සුළං' ටෙලියෙන් රංගන කලාවට අත්පොත තබනවා. ටෙලි තිරය තුළ ඕෂධී තරුවක් වන්නේ සුසිල නිෂ්පාදන හරහායි. ඒ, දේදුණු පාලම, සඳ දුරනම් සහ අසුරාවේශය වැනි ටෙලි නිර්මාණ හරහායි. හිටි අඩියේම රංගනයෙන් මඳකට මිදී ඈතට යන ඈ, දේශපාලනයට මැදිවෙනවා. ඒ වගේම නොසිතූ විදියට ඈ දේශපාලනයෙන්ද සමුගන්නවා. හැම දේකින්ම ඕෂධී ඒ විදියට ඈත් වුණේ ඇයි? සාමාන්‍ය ජීවිතය නිදහස් යැයි ඇයට හිතුණු නිසාද? මේ දවස්වල ඈ මොනවද කරන්නේ? ඔන්න 'හාට්' එකේ අපි තොරතුරු ටිකක් දැනගන්න ඕෂධීව හොයාගෙන ආවා.**

**ඉතින් ඕෂධී කොහොමද ඔබේ සුවදුක්?**

වරදක් නැහැ. සුවෙන් සතුටින් ඉන්නවා. සතුටුයි ඇත්තටම මාධ්‍යයට අපව තවමත් මතක තියෙනවට. මොකද කියනවා නම් හිස් දේවල් සහ එලකට නැති බොරු ගොසිප් උළුප්පා දක්වන සෝෂල් මීඩියාවලට වැඩිය 'මව්රට' වැනි අනන්‍යතාවක් තියෙන පුවත්පතක අපි ගැන සටහනක් තියන්න ලැබෙන එක ගෞරවයක්.

**මොනවද අලුත් තොරතුරු කියලා අහනවා නම්?**

කලා තොරතුරු ගැන නම් කියන්න දෙයක් හෝ යමක් නැහැ. අලුත් ටෙලියක රඟපාන්න කාලෙකින් නොලැබුණු නිසා රූගත කිරීමකට සහභාගි වුණෙත් නැහැ.

**රංගනය ඒ තරමට එපා වුණාද ඕෂධී?**

රංගනය එපා වුණේ නැහැ. එපා වෙන්නෙත් නැහැ. වැඩේ කියන්නේ දැන් මගේ කාලයෙන් වැඩි කොටසක් වැය වෙන්නේ මගේ දරු පවුල සහ ව්‍යාපාර කටයුතු වෙනුවෙනුයි.

**බිස්නස් බොහොම සරුයි ඒ කියන්නේ?**

මෙහෙමයි. මගේ සැලෝන් එකට එන අයට අවශ්‍ය ට්‍රීට්මන්ට් එක දෙන්නේ මගේ මූලිකත්වයෙන්මයි. මොකද ට්‍රීට්මන්ට් එක හොඳට තිබුණොත් විතරයි පළමු වතාවට ආව කස්ටමර් ආයෙමත් එන්නේ. ඒ නිසා සැලෝන් එකේ මම ඉන්නම ඕනෙ නිසා රංගනයට කාලය දීම ටිකක් අපහසුයි.

**සැලෝන් එකට කට්ටිය එන්නේ ඔබ ඕෂධී හේවාමද්දුම කියන නිළිය නිසාද?**

මුල් දවස්වල ඒක එහෙමත් වුණා. හැබැයි පස්සෙන් පහුවට ඒ අය ආවේ මගේ සේවා දායකත්වය හොඳ තැනක තිබුණු නිසයි.

**කොහොමත් ඕෂධී හේවාමද්දුම කියන සුන්දර රංගවේදිනියවම ප්‍රේක්ෂකයන්ට අහිමි වුණා?**

රංගන ක්ෂේත්‍රයට ඇවිදින් අවුරුදු 22ක් ගතවුණා. ඒ කාලය ඇතුළත මම ඇතිවෙන්න රඟපෑවා. හැම දවසකම වගේ පුංචි තිරය හරහා ආලින්දයේ සිනමාවට ආවා. ප්‍රේක්ෂකයන් පිනවූවා. ඒ මදැයි ඉතින් කියලා තමයි මට හිතෙන්නේ.

**ජනප්‍රියම ටෙලි නිළිය ලෙස ඔබ සම්මානත් ගත්තා?**

ගත්තා නෙවෙයි ඒ සම්මානය මට ලැබුණා. මම විවාහ වුණේ වයස අවුරුදු 22දී. වෙඩින් එකට සති කිහිපයක් තියෙද්දි 2007 ජනප්‍රියම ටෙලිනාට්‍ය නිළිය ලෙස මට සුමති සම්මානය ලැබුණා.

**එච්චර ඩිමාන්ඩ් එකක් තියෙද්දි රංගනයෙන් අයින් වෙන්න හිතුණේ විවාහය නිසාද?**

නැහැ. මම විවාහයෙන් පසුවත් රංගනයෙහි යෙදුණා. හොඳ නිර්මාණ කළා. හැබැයි පුතා ඉපදුණාට පස්සේ රංගනය නිසා පුතා වෙනුවෙන් මෙම දියයුතු කාලය එයාට අහිමි කරන්න මට හිතුණේ නැහැ. ඒ නිසා හුඟක් නිර්මාණ එතැනදී රිජෙක්ට් වුණා.

**අද ඒ ගැන පසුතැවෙනවද ඕෂධී?**

කවදාවත්ම නැහැ. එයට හේතු දෙකක් තියෙනවා. එකක් මම මගේ පවුලට අංක එක දුන්නා. අනෙක මම නිළියක ලෙස ඉහළ තැනකට එන්න කවදාවත් හීන මැව්වේ නැහැ. රංගනයට ආවේ අහම්බෙන්.

**එහෙම නම් ටෙලිනාට්‍ය මහ ගොඩක රංගනයට දායක වෙන්න හිතුවේ ඇයි?**

නිවේදන කටයුතු කළා මුලින්ම. ඉන් පස්සේ ඇඩ්වර්ටීස්මන්ට්වලට ආරාධනා බොහොමයක් ආවා. ඒ ඇඩ්වර්ටීස්මන්ට් දැකලා සුසිල නිෂ්පාදන හරහා ආරාධනා ලැබුණා 'දේදුණු පාලම' ටෙලියට. එය විකාශය වෙන්නත් කලින් ඔවුන්ගෙ'ම නිෂ්පාදනවලට තව හවුල් වෙන්න වාසනාව ලැබුණා. හිතපු නැති විදියට දිගින් දිගටම තිරපිටපත් ලැබෙන්න ගත්තා. ඒ හැම එකක්ම හොඳ නිර්මාණ නිසා ඒවා භාරගත්තා. ඔන්න ඔහොම තමයි නිළිකම ඉබේම වෘත්තියක් වුණේ.

**ඇතැම් පිරිස් හිතුවේ ඔබ ක්‍රියාකාරී දේශපාලනය නිසා රංගනයට සමුදුන්නා කියලා?**

වැරැදි නිගමනයක්. මම ඉගෙන ගත්තෙත් බිස්නස් මැනේජ්මන්ට් පාඨමාලාවකට යන්න බලාගෙනයි. මගේ ආශාව බලාපොරොත්තුව වුණේ ව්‍යාපාරකරණයයි. අනෙක වෘත්තීය නිළියක් වුණා කිව්වත් ලංකාවේ කලාකාරියට රංගනයෙන් විතරක් ජීවත් වෙන්න පුළුවන්කමක් තියෙනවද? අද කාලේ කොහොමත් බැහැ.

ඒ නිසා දේශපාලනයට යොමුවෙන්න කලින් මම ව්‍යාපාරවලට ආවා. රංගනයට වෙන් කරන්න කාලය නැති වුණේ ඒ නිසයි. දෙවැනියට දුව ලැබුණට පස්සේ කොහොමත් ටෙලිනාට්‍ය භාරගන්න හැකියාවක් තිබුණේ නැහැ. දේශපාලනය නිසා රංගනයට තිත තිබ්බා කියන කතාව සම්පූර්ණයෙන් වැරැදියි.

**හොඳයි රංගනය පැත්තකින් තියමු. ක්‍රියාකාරී දේශපාලනයෙන් සමුගත්තේ ඇයි?**

කවුද කියන්නේ මම දේශපාලනයෙන් සමුගත්තා කියලා? මම කැමැතියි ක්‍රියාකාරී දේශපාලනයට. කවදාවත් මම එයින් සමුගන්නේ නැහැ. හැබැයි නැවත හරි කාලය එනතුරු මම කෙටි විරාමයක් ගත්තා. එය කිසිවිටෙකවත් සමුගැනීමක් නෙවෙයි.

**හරි කාලය යනුවෙන් ඔබ අදහස් කරන්නේ?**

මට හිතෙන හැටියට ලංකාවේ දේශපාලනය තවම හරියටම හරි කියන ට්‍රැක් එකට වැටිලා නැහැ. තවත් විදියකට කියනවා නම් ප්‍රතිපත්තිගරුකව මැදිහත් වෙන්න පුළුවන් දේශපාලනයක් මේ රටේ නැහැ.

**ඔබ ඔය කියන හරි ලකුණ දෙන්න පුළුවන් ලංකාවේ දේශපාලන පක්ෂයක් නම්කරන්න පුළුවන්ද?**

පාටක් හෝ පක්ෂයක් ගැන මෙතැන මම සඳහන් කරන්නේ නැහැ. මේ රටේ පාලනය භාරගන්න හැම පක්ෂයකම රට හොඳ තැනකට ගේන්න ඕනෑය කියන පිරිසක් ඉන්නවා. ඊටම හරියන්න ඒ සැලැස්ම අච්චාරු කරන පිරිසකුත් ඉන්නවා. අන්න ඒ නිසා මොන පක්ෂය බලයට ආවත් මේ රට ගොඩනගන්න පුළුවන් නිවැරැදි පසුබිමක් සකසන්න අමාරුයි.

**ඔබ දේශපාලනයෙන් මදකට හෝ ඈත් වුණේ කලකිරීම් මැද නොවේද?**

කලකිරීම් තිබුණේ නැහැ කියලා කියන්න බැහැ. විශේෂයෙන්ම කාන්තාවක් දේශපාලනයට ආවාම මඩ ගහන්න බලන් ඉන්න පිරිස වැඩියි.

**ඔබටත් ඒ මඩ ප්‍රහාරයන්ට මුහුණ දෙන්න සිදුවුණාද?**

මම මඩ ප්‍රහාරවලට ලක්විය යුතු චරිතයක් නෙවෙයි. ඕෂධී හේවාමද්දුම කියන්නේ පුද්ගලික ජීවිතය තුළ වාගෙම රංගන ජීවිතය තුළත් ඉතා වැදගත් හොඳ ප්‍රතිරූපයක් තිබුණු කාන්තාවක්.

අන්න ඒ ප්‍රතිරූපය මැදයි මම දේශපාලනයට ආවේ. පරම්පරාගත පවුල් දේශපාලනය හෝ වෙනත් බලපුළුවන්කාරකමක් නැතිව පැහැදිලි ස්වාධීන ආරම්භයකිනුයි මම ආවේ. ඒත් කිසිම හේතුවක් නැතුව මගේ ගමනට හරස් කපන්න තරම් ඇතැමුන් කුහක වුණා.

**එවක හිටපු විපක්ෂය ගැනද ඔබ කියන්නේ?**

විපක්ෂයකින් ගහන එක හෝ හරස් කපන ක්‍රමවේදය කොහොමත් කොතැනත් වෙනවනේ. මම කියන්නේ පක්ෂය ඇතුළතින්ම මට ආ ප්‍රහාර ගැනයි. කිසිම හේතුවක් නැතුව ඔවුන් මට මඩ ගැහුවා. මගේ කකුලෙන් ඇද්දා. ඉදිරි ගමනට හරස් කැපුවා.

**කුමක් මුල් කරගෙනද ඔවුන් එහෙම කළේ කියලා පැහැදිලි අදහසක් දෙන්න බැරිද?**

හැම දේටම මුල මනාප ක්‍රමයයි. මනාප ක්‍රමය නිසා තමයි පක්ෂයක් ඇතුළතම බොහොමයක් දෙනාට හතුරෝ හැදෙන්නේ.

අනේ ඇත්තටම ඔය මනාප ක්‍රමය නැතිවෙලා යනවා නම් ඒක ලොකු යහපතක්. මොකද මනාප ක්‍රමය කියන්නේ කිසිම වැඩකට නැති දෙයක්.

**ආයෙමත් ඔබ ක්‍රියාකාරී දේශපාලනයට එන්න බලාපොරොත්තුවක් තියෙනවද?**

අනිවාර්යයෙන්ම මම එනවා. හැබැයි දැන්මම නෙවෙයි. කොහොමත් විශේෂයෙන්ම මේ ඊට කාලය නෙවෙයි. ඒ වගේම මේ යන තත්ත්වය අනුව නම් එය කොහොමත් සිදුවන එකක් නැහැ.




**ට්‍රීට්මන්ට් එක හොඳට තිබුණොත් විතරයි කස්ටමර් ආපහු එන්නේ.**

**මල්මි කෞෂල්‍යා**




# කෝටියක් දෝෂ භංග කරන සුරගුරු

## ඔබේ කේන්ද්‍රයේ ගුරු බලපෑම මෙන්න...

**පෙරදිග අහස් කුසෙහි රක්ත වර්ණ ආලෝක ධාරාවක් විහිදුවමින් පායා එන සුරගුරු හෙවත් බ්‍රහස්පති යනු, විශ්වයේ මහා කරුණාවන්තම සහ ශුභවාදීම ග්‍රහ දෙවියන් ලෙස හැඳින්වීම නිවැරදිය. මිනිසෙකු මෙලොව උපදින ක්ෂණයෙහි, විශ්වයේ ශක්ති රේඛාවන් කේන්ද්‍ර සටහනක් මත සනිටුහන් වන විට, ගුරු ග්‍රහයා සිටින ඉරණම් පංගුව දෙස ජ්‍යොතිෂවේදීන් නෙත් යොමු කරන්නේ මහත් වූ භක්තියකිනි. මන්ද, මිනිසෙකුගේ ලෞකික සැප සම්පත් මෙන්ම ලෝකෝත්තර ඥානය ද තීරණය කරන ප්‍රධානතම මඟපෙන්වන්නා වන්නේ මේ සුරගුරු බැවිනි.**

පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත් බොහෝ අංශ කෙරෙහි ගුරු ග්‍රහයාගේ සෘජු බලපෑම එල්ල වන අතර උසස් ඉගෙනීම, තීක්ෂණ බුද්ධිය, යානවාහන, ගේදොර, නිශ්චල දේපළ, ගුණග රුක බව, වාසනාවන්ත දරුඵල, යහපත් විවාහය, ආගම ධර්මය කෙරෙහි ඇති සහජ නැඹුරුව, සැප සම්පත් විඳීම මෙන්ම ප්‍රීතිමත් ප්‍රසන්න ජීවිතයක් ගතකිරීම යන මේ සියලු උදාර කරුණු නියෝජනය කරන්නේ ගුරු ග්‍රහයාය. කෙසේ වුවද, ගුරු ග්‍රහයා කේන්ද්‍රයක තැන්පත්ව ඇති ආකාරය අනුව ශුභ පල මෙන්ම අශුභ පලද උදාවිය හැකි බැවින්, කේන්ද්‍රයේ එක් එක් ස්ථානවලදී ගුරු ලබාදෙන සුබ අසුබ ප්‍රතිඵල පිළිබඳව විමසා බලමු.

යම් පුද්ගලයෙකුගේ කේන්ද්‍රයක ලග්නය හෙවත් පළමුවැන්න තුළ ගුරු ග්‍රහයා තැන්පත් වීම අතිශය බලවත්, වාසනාවන්ත පිහිටීමකි. මෙහිදී ගුරු ග්‍රහයා ලග්නයට දිග්බල වන අතර, ලග්නගත ගුරුගේ දිව්‍යමය දෘෂ්ටිය කේන්ද්‍රයක ඇති ඉතා බලවත්ම ත්‍රිකෝණ ස්ථාන වන පස්වැන්න, හත්වැන්න සහ නවවැන්න වෙත සෘජුවම එල්ල වෙයි. මේ දිව්‍යමය බැල්ම හේතුවෙන් කේන්ද්‍රයේ ඇති බොහෝ සහජ දෝෂ භංග වී යන තත්ත්වයක් උදා වන අතර, පැරණි ඍෂිවරුන් 'ගුරු ලග්නයේ සිටීමෙන් කෝටියක් දෝෂ භංග වේ' යැයි ජ්‍යොතිෂයේ රත්තරන් අකුරින් දක්වා ඇත්තේ එබැවිනි. විශේෂයෙන්ම ධනු ලග්නය, කටක ලග්නය සහ මීන ලග්නයෙන් උපන් අයට ලග්නයේ ගුරු තැන්පත් වීම මුළු ජීවිතයම ආලෝකමත් කරන ප්‍රබලතම පිහිටීමක් වෙයි.

එතැනින් නොනැවතී, ගුරු ග්‍රහයා කේන්ද්‍රයක දෙවැන්නේ තැන්පත් වීමද ජීවිතයට විශාල ආශිර්වාදයක් රැගෙන එයි. ගුරුට 'ධන කාරක' අයිතියක් ඇති අතර, දෙවැන්න ධනස්ථානය ද වන බැවින් අපේක්ෂිත ධනය ලැබීමට, ව්‍යාපාර දියුණුවට සහ පාරම්පරික දේපළ උරුමවීමට මෙම පිහිටීම මග පාදයි. තවද, දෙවැන්න යනු පවුල නියෝජනය කරන කුටුම්භස්ථානයයි. එබැවින් ගුරු දෙවැන්නේ සිටීම විවාහ ජීවිතයේ යහපත් පැවැත්ම, සතුට, සාමය සහ පවුලේ සමෘද්ධිය කෙරෙහි අතිශය ශුභවාදී බලපෑම් ඇති කරයි. කෙසේ වෙතත්, තුන්වැන්නේ ගුරු ග්‍රහයා තැන්පත් වීම සාමාන්‍යයෙන් එතරම් ශුභ පිහිටීමක් ලෙස සැලකෙන්නේ නැත. තුන්වැන්නට ගුරු 'පල රහිත ග්‍රහයෙකු' වශයෙන් හැඳින්වෙන මුත්, යම් හෙයකින් එම තුන්වැන්න ගුරුගේම රාශියක් (ධනු හෝ මීන) වී හෝ ගුරු එහි උච්චව (කටක රාශියේ) තැන්පත් වුවහොත්, එම අසුබතා මඟහැරී ශුභ පල ලබාදීමට දායක වේ. එමෙන්ම ගුරු තුන්වැන්නේ සිටින විට හත්වැන්න, නවවැන්න හා එකොළොස්වැන්න ගුරුගේ දෘෂ්ටියට ලක් වන බැවින් එම භාවයන් කෙරෙහි ශුභවාදී බලපෑම් ඇති කිරීමට සමත් වෙයි.

ජීවිතයේ භෞතික සැප සම්පත් ගැන කතා කිරීමේදී හතරවැන්නේ ගුරු ග්‍රහයා තැන්පත් වීම අතිශයින්ම ශුභදායක පිහිටීමකි. හතරවැන්නෙන් ගේදොර, යාන වාහන, ඉඩකඩම්, විවාහ ජීවිතයේ සතුට මෙන්ම ජීවිතයේ අවසාන කාලය නියෝජනය කෙරෙන බැවින්, එහි ගුරු තැන්පත්වීම මුළු ජීවිතයටම ශුභවාදී බලපෑම් ඇති කරයි. මෙවැනි පිහිටීමක් ඇති අයට තමන්ටම කියා අලංකාර නිවසක් හිමිවීම, නිශ්චල දේපළ ලැබීම, ගුණගරුක සහකරුවකු

20 පිටුවට

19 පිටුවෙන්

# උසස් අධ්‍යාපනයයි වාසනාවයි දෝරේ ගලන නවවැන්න...



හෝ සහකාරියක හිමිවීම, යහපත් මානසික සුවයක් ලැබීම සහ විවාහ ජීවිතය අතිශයින් සතුටින් ගතකිරීමේ වාසනාව උදා වේ. එලෙසම කේන්ද්‍රයක පස්වැන්නේ ගුරු ශුභවාදී ආකාරයෙන් තැන්පත්වීම යහපත් දරුවන් ලැබීමේ භාග්‍ය උදාකර දෙයි. විශේෂයෙන්ම පස්වැන්න අධිපතියා සහ පුත්‍රකාරක ගුරු යහපත් ආකාරයෙන් තැන්පත්ව සිටීනම් වාසනාවන්ත, බුද්ධිමත් දරු සම්පත් ලැබේ. ස්ත්‍රී කේන්ද්‍රයක ගුරු යහපත් ආකාරයෙන් සිටීම දරුඵල කෙරෙහි සෘජුවම ශුභවාදීව බලපාන අතර, ගුරුගේ දෘෂ්ටිය පස්වැන්න වෙත යහපත් ආකාරයෙන් සම්බන්ධ වේ නම් දරුඵල කෙරෙහි යහපත් බලපෑම් ඇතිකරයි. එමෙන්ම ගුරු ලග්නයේ, පස්වැන්නේ, නවවැන්නේ සහ එකොළොස්වැන්නේ ගෝචරයෙන් ගමන් කරන කාල සීමාවන් දරුඵල බලාපොරොත්තු වන අයට ඉතාම සුදුසු වකවානු ලෙස හැඳින්විය හැකිය. එහෙත්, පුත්‍රකාරක ගුරුත්, පස්වැන්න අධිපතිත් පීඩාවීම දරුඵල හීන වීමට හෝ දරුඵල නොමැතිවීමට වුවද හේතුවිය හැකිය. ගුරු කේන්ද්‍රයක නීච වීම හෝ ගුරු සහ පස්වැන්න අධිපති 6, 8, 12 යන දුෂ්ට ස්ථානවල තැන්පත්වීම දරුඵල කෙරෙහි අයහපත් ලෙස බලපායි. මෙහිදී විශේෂත්වයක් වන්නේ, පුත්‍රකාරක ගුරු පුත්‍රස්ථානය වන පස්වැන්නේම තැන්පත් වීම "කාරක භාව නාශාය" සිද්ධාන්තයට අනුව එම කාරක ගුණයට හානි කරවන තත්ත්වයක් ඇතිවීමයි. එසේ වුවත් එය සෑමවිටම ඒ ආකාරයෙන්ම සිදු නොවන අවස්ථා ප්‍රායෝගිකව දක්නට ලැබේ.


ජ්‍යොතිෂයේ දුෂ්ට ස්ථාන ලෙස සලකන 6, 8, 12 යන භාවයන්හි ගුරු ග්‍රහයා තැන්පත් වීම පොදුවේ එතරම් ශුභ පල ලබා නොදෙන පිහිටීමකි. හයවැන්නේ ගුරු තැන්පත් වූ විට නොයෙකුත් ලෙඩ රෝග ඇතිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, අටවැන්නේ ගුරු සිටීම ද ශුභ පල අවම කරන පිහිටීමකි. එමෙන්ම දොළොස්වැන්නේ ගුරු සිටීමෙන් ගුරුගේ මහ දශා කාලයකදී හෝ අතුරු දශා කාලයකදී නොයෙකුත් ලෙඩදුක් හා කරදර ඇතිවීම කෙරෙහි බලපෑ හැකිය. එසේ වුවත් ගුරු 6, 8, 12 භාවයන්හි බලවත්ව (උච්ච හෝ ස්වක්ෂේත්‍රව) තැන්පත් වී ඇත්නම් සහ ශුභ දෘෂ්ටි සහිතව සිටී නම් මෙම අශුභ පල අවම වී යයි. මීළඟට අප අවධානය යොමු කළ යුත්තේ විවාහස්ථානය වන 07 වැන්න වෙතයි. ගුරු ග්‍රහයා හත්වැන්නේ තැන්පත්වීම විවාහ ජීවිතය කෙරෙහි විශේෂිත, ආශ්චර්යමත් බලපෑමක් ඇති කරන පිහිටීමකි. ගුරු හත්වැන්නේ සිටින අයට යහපත්, ගුණගරුක විවාහ සහකරුවකු හෝ සහකාරියක ලැබීමේ වාසනාව හිමි වේ. එසේ වුවත්, විවාහය යනු සතුට, විනෝදය සහ ආශාවන් ආදී ලෞකික දේවල්වලින් පිරුණු එකකි. නමුත් ගුරු යනු ලෝකෝත්තර ස්වභාවයක් ගන්නා, අධ්‍යාත්මයට බර ග්‍රහයෙකි. එබැවින් ගුරු හත්වැන්න හා සම්බන්ධ වූ විට විවාහ ජීවිතයේ ලෞකික ප්‍රීතිය හා සතුටට යම් බාධා ඇති වේ. ගුරු හත් වැන්නේ සිටින අය විවාහ වූ මුල් කාලයේදී සතුටින් ගත කළ ද, කලක් ගතවන විට ලෞකික පැත්තට වඩා ලෝකෝත්තර පැත්තට බර වන ස්වභාවයක් ඇතිවන බැවින් විවාහ ජීවිතය ගැන කලකිරීමක් ඇතිවිය හැකිය. මේ නිසා අඹුසැමියන් අතර නොයෙකුත් මතභේද ඇතිවිය හැකි බැවින්, ගුරු හත්වැන්නේ සිටින අයට වඩාත්ම ගැළපෙන්නේ කේන්ද්‍රයේ හත්වැන්නේම ගුරු සිටින සහකරුවකු හෝ සහකාරියක වීමයි.

කේන්ද්‍රයක නවවැන්න හෙවත් භාග්‍යස්ථානය තුළ ගුරු තැන්පත්වීම ද ඉතා ශුභ පිහිටීමක් වශයෙන් සැලකිය හැකිය. විශ්ව කේන්ද්‍රයේ භාග්‍යස්ථානය ගුරුට අයත් (ධනු රාශිය) බැවින්, නවවැන්නේ ගුරු තැන්පත්වීම හොඳ උසස් අධ්‍යාපනයක් ලැබිය හැකි ප්‍රබල පිහිටීමකි. තවද, පුත්‍රස්ථානය වන පස්වැන්නෙන් පස්වැන්න නවවැන්න වන බැවින්, නවවැන්නේ ගුරු තැන්පත්වීම දරුපල කෙරෙහි ද ශුභවාදී බලපෑම් ඇති කරයි. යහපත් ආකාරයෙන් ගුරු නවවැන්නේ තැන්පත් වීම ගුණගරුක, නීතිගරුක, අවංක මෙන්ම වාසනා ගුණයෙන් පරිපූර්ණ උදාර පුද්ගලයෙකු බිහි කරයි. එමෙන්ම දසවැන්නේ ගුරු තැන්පත්වීම වෘත්තීය ජීවිතය ජයග්‍රහණය කරවන ශුභ පිහිටීමකි. ගුරු දසවැන්නේ පිහිටි අයට රජයේ ඉහළම තනතුරු සහ උසස් රැකියාවන් හිමිවීමේ වාසනාව ලැබෙන අතර, තමන් ලැබූ තනතුරේ දිනෙන් දින ඉහළටම යාමට භාග්‍ය හිමිවේ. තමන් කරන රැකියාවෙන් උපයන මුදලින් තමන්ගේ මෙන්ම පවුලේ දියුණුව සලසා ගැනීමේ වාසනාවද මේ හරහා උදා වේ. අයස්ථානය වන එකොළොස්වැන්නේ ගුරු තැන්පත්වීමද යහපත් පිහිටීමකි. ගුරුට ධන කාරක අයිතියක් ද ඇති බැවින් එකොළොස්වැන්නේ ගුරු තැන්පත්වීම අසීමිත ලෙස ධනය ලැබීමේ වාසනාව ඇති කරයි. එම ගුරු දෙවැන්න (ධනස්ථානය) හා සම්බන්ධ වීමෙන් එහි ප්‍රතිඵල තවදුරටත් දෙගුණ තෙගුණ වීමට දායක වේ.

## රජයේ ඉහළම පුටු සහ සල්ලි මිටි පිටින් දෙන 10 සහ 11

ගුරු ග්‍රහයා එක් එක් රාශිවලදී ගන්නා තත්ත්වයන් දෙස බැලීමේදී, ගුරු මේෂ රාශියේදී මිත්‍ර වන අතර වෘෂභයට සතුරු වේ. මිථුන රාශියේදී ගුරු සතුරු වන අතර කටකයට ගුරු උච්ච වී උපරිම බලවත් වේ. සිංහයට මිත්‍ර වන ගුරු, කන්‍යාවට සහ තුලාවට සතුරු වෙයි. වෘශ්චිකයට මිත්‍ර වන අතර ධනුවට ස්වක්ෂේත්‍රව බලවත් වේ. මකරයට ගුරු නීච වී බල රහිත වන අතර කුම්භයට සම වේ. මීන රාශියේදී ගුරු නැවතත් ස්වක්ෂේත්‍ර බලය ලබයි. විවාහය සිද්ධ වන කාලය තීරණය කිරීමේදී ද ගුරු ග්‍රහයා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ගුරු ගෝචරයෙන් හත්වැන්නේ ගමන් කරන කාලය, ගුරු හත්වැන්න අධිපති පිහිටි රාශියේ ගමන් කරන කාලය, හත්වැන්න අධිපති නවාංශකයේ පිහිටි රාශියේ සිට පස්වැන්නේ සහ නවවැන්නේ ගමන් කරන කාලය ද විවාහයක් සිද්ධ කරගැනීමට ඉතා සුදුසු කාලයන් වේ. ගුරු ලග්නයේ ගමන් කරන විට හත්වැන්න ගුරුගේ දෘෂ්ටියට ලක්වන බැවින් එම කාලයද විවාහයට සුදුසුය. එමෙන්ම ගුරු තුන්වැන්නේ සහ එකොළොස්වැන්නේ ගමන් කරන විටද හත්වැන්න දෘෂ්ටියට ලක්වන බැවින් එම කාල සීමාවන්ද විවාහයට අතිශය සුදුසුය. ශුභ නැකැත් සෑදීමේදී ගුරු ග්‍රහයා සුවිශේෂ දායකත්වයක් ලබාදෙන අතර, විවාහයක් සිදුකිරීමේදී 'ගුරු හෝරාව' යොදාගැනීම ඉතා ශුභය. විවාහ නැකැත් සෑදීමේදී තත්කාල කේන්ද්‍රයේ ගුරු ලග්නයේ තබා සාදන නැකතේ සියලු දෝෂ භංග වන බව ජ්‍යොතිෂයේ සඳහන් වේ. විවාහ මංගල නැකැත්වලදී ගුරු ග්‍රහයා තත්කාල කේන්ද්‍රයේ පාප ග්‍රහයන්ගෙන් පීඩාවීම හෝ පාපකර්තරී නොවී සිටීමට වගබලා ගත යුතුය.

## සුපිරි සල්ලිකාරයෝ බිහි කරන මහා යෝග...



ගුරු ග්‍රහයා මුල් කරගනිමින් කේන්ද්‍රයක අතිශය බලවත් මහා ග්‍රහ යෝග කිහිපයක් නිර්මාණය වේ. ගුරු ග්‍රහයා උච්ච හෝ ස්වක්ෂේත්‍රවී කේන්ද්‍රයක 1, 4, 7, 10 යන කේන්ද්‍රස්ථානවලින් එකක තැන්පත් වීමෙන් පංච මහා පුරුෂ යෝගවලින් එකක් වන "ගුරු හංස යෝගය" උදාවන අතර එය අතිශය බලවත් යෝගයකි. එසේම ගුරු හා සඳු එක්ව සිටීමෙන් හෝ එම දෙදෙනා සමසප්තමව (ප්‍රතිමුඛව) හිඳීමෙන් "ගජකේෂරී යෝගය" උදා වේ. මෙය සඳුගෙන් උදාවන යෝගයක් වුවත් ගුරු සම්බන්ධ වන බැවින් සුවිශේෂී වේ. තවද ගුරු සහ කුජ (අඟහරු) එකට සංයෝග වීමෙන් "ගුරු මංගල යෝගය" උදාවේ. යහපත් භාවයක බලවත්ව මෙම යෝගය යෙදුණු විට අතිශය ශුභ පල ලබාදේ. මෙවැනි බලවත් යෝග සමාජයේ ඉහළතලවලට ගිය වැදගත් සහ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ කේන්ද්‍රවල බහුලව දක්නට ඇත. මීට අමතරව අනෙකුත් ග්‍රහයන් සමග සංයෝග වීමෙන්ද තවත් ග්‍රහ සංයෝග සෑදෙන අතර, එහිදී ගුරු සහ අනෙකුත් ග්‍රහයන් පිහිටා ඇති බලවත්කම අනුව සහ තැන්පත්ව ඇති රාශිය අනුව ශුභ හෝ අශුභ පලවල ප්‍රබලතාව තීරණය වේ. මේ අයුරින් සමස්තය දෙස බලන විට ගුරු ග්‍රහයා පුද්ගලයෙකුගේ ජීවිතයේ බොහෝ අංශ කෙරෙහි ප්‍රබල දායකත්වයක් ලබාදෙන උත්තම ග්‍රහයෙකි. ගුරු ග්‍රහයා යහපත් ආකාරයෙන් කේන්ද්‍රයක තැන්පත් වීම නිසා, එම පුද්ගලයා සමාජයට වැඩදායක, ගෞරවාන්විත ජීවිතයක් ගත කරන, තමන්ගේ පවුලේ සුබසිද්ධිය වෙනුවෙන් කැපවෙන, අවංක, නීතිගරුක මෙන්ම බොහෝ දෙනෙකුට ජීවිතයට ගුරුහරුකම් ලබාදෙන, සර්වප්‍රකාරයෙන්ම තෘප්තිමත් උදාර මිනිසෙකු බවට පත්කිරීමට විශ්වීය වශයෙන් ප්‍රබල දායකත්වයක් ලබාදෙයි.

**ජ්‍යොතිෂවේදී**
**ඔස්මන් පෙරේරා**